ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
**මැයි 2020**

# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 මැයි මාසයේ දී සැලකිය යුතු ලෙස වර්ධනය වෙමින් 49.3ක අගයක් වාර්තා කරන ලදී. මෙය අප්‍රේල් මාසයෙහි වාර්තා වූ සමීක්ෂණය ආරම්භයේ සිට මෙතෙක් පැවති අවම අගය වන 24.2ට සාපේක්ෂව දර්ශකාංක 25.1ක ඉහළ යාමකි. සංචරණ සඳහා පනවා තිබූ නීති ක්‍රමයෙන් ලිහිල් කිරීම, නිෂ්පාදන අංශයෙහි ආර්ථික ක්‍රියාකාරකම් යථාවත් වීම කෙරෙහි ප්‍රධාන ලෙස දායක විය.

විශේෂයෙන් ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි සහ රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ නිෂ්පාදිත පරිමාවේ සිදුවූ සැලකිය යුතු ඉහළ යාම පිළිබිඹු කරමින්, නිෂ්පාදන උප දර්ශකය, 2020 අප්‍රේල් මාසයේදී වාර්තා කළ 3.5ක අගයට සාපේක්ෂව, 2020 මැයි මාසයේදී 51.1ක ඉහළ අගයක් වාර්තා කරන ලදී. තවද, නව ඇණවුම්, තොග මිලදී ගැනුම් හා සේවා නියුක්ති උප දර්ශක ද 2020 මැයි මාසය තුළ සැලකිය යුතු ලෙස වර්ධනය වූ නමුත් තවදුරටත් කඩයිම් මට්ටමට වඩා පහළ අගයක පැවතුණි. මේ අතර, සැපයුම් දාමයේ පැවති අවහිරතා ක්‍රමයෙන් සමනය වන බවට පිළිබිඹු කරමින් මෙම කාල සීමාව තුළ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය අඩු වේගයකින් ඉහළ යන ලදී.

රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ සහ රසායනික හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන අංශයේ ඇතැම් ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කළේ තම නිත්‍ය නිෂ්පාදන සඳහා මෙතෙක් ඇණවුම් ලැබී නොමැති බැවින් ඔවුන් එයට විකල්පයක් ලෙස සෞඛ්‍ය ආරක්ෂාව හා සම්බන්ධ නිෂ්පාදන නිපදවීම කෙරෙහි යොමුවී ඇති බවයි.

| විචල්‍යය | අප්‍රේල් | මැයි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **24.2** | **49.3** | **+** | **අඩු වේගයකින් පහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 11.1 | 47.3 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිෂ්පාදන | 3.5 | 51.1 | + | පහළ යාමක සිට ඉහළ යාමක් |
| සේවා නියුක්තිය | 29.9 | 37.8 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 9.7 | 47.9 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 86.8 | 66.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


COVID-19 වසංගතය හේතුවෙන් පාරිභෝගික ඉල්ලුම කෙරෙහි තවදුරටත් පවතින අහිතකර බලපෑම් පිළිබඳ ප්‍රතිචාර දක්වන්නන් සැලකිළිමත් වුවද නිෂ්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ ඔවුන්ගේ අපේක්ෂාවන් පසුගිය මාසයට සාපේක්ෂව සැළකියයුතු වැඩි වීමක් පෙන්නුම් කරයි.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**49.3**

**2020 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 25.1ක ඉහළ යාමකි.**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 2.6 කින් ඉහළ යමින් 2020 මැයි මාසයේදී 42.4 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

COVID 19 වෛරසයේ අහිතකර බලපෑම හේතුවෙන් 2020 මැයි මාසයේදී, ඉන්දියාව, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සහ රුසියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය තව දුරටත් පහළ මට්ටමක පැවති අතර චීනයෙහි නිෂ්පාදන අංශයෙහි ගැනුම් ළමනාකරුවන්ගේ දර්ශකය ඉහළ යන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 ජූනි 15 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 මැයි මාසයේ දී 43.1ක් ලෙස වාර්තා වූ අතර, එය සමීක්ෂණය ආරම්භයේ සිට මෙතෙක් වාර්තා කළ අවම දර්ශක අගය වන 2020 අප්‍රේල් මාසයේ දී වාර්තා වූ 29.8ට සාපේක්ෂව සැලකිය යුතු ඉහළ යෑමකි. රට තුළ COVID-19 වසංගතය පැතිර යෑම පාලනය කිරීමෙන් අනතුරුව, ජන ජීවිතය සහ ආයතනික කටයුතු යථාවත් කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් උපදර්ශකවල සිදු වූ ඉහළ යෑම මේ සඳහා දායක විය.

COVID-19 වසංගතය පාලනය කිරීම සඳහා පනවන ලද අභ්‍යන්තර ගමනාගමන සීමාවන් ඉවත් කිරීමත් සමග ප්‍රවාහන සහ තොග හා සිල්ලර වෙළඳ උපඅංශයන්හි අලුත් ව්‍යාපාර කටයුතුවල සිදු වූ වර්ධනය හේතුවෙන් නව ව්‍යාපාර උපදර්ශකය 2020 මැයි මාසයේ දී ඉහළ ගියේය.

සේවා කටයුතුවල පහළ යෑමෙහි පාලනය වීමක් පෙන්නුම් කරමින් ව්‍යාපාර ක්‍රියාකාරකම් උපදර්ශකය ද 2020 මැයි මාසය තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ව්‍යාපාර ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පැමිණීමත් සමග ප්‍රවාහන, තොග හා සිල්ලර වෙළඳාම, වෘත්තීය සේවා සහ සන්නිවේදන උපඅංශයන්හි ව්‍යාපාර ක්‍රියාකාරකම් 2020 අප්‍රේල් මාසයට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, හෝටල්වල මෙහෙයුම් කටයුතු මත පනවන ලද සීමාවන් සහ අඛණ්ඩව දෙවන මාසයටත් විදේශ සංචාරකයන් නොපැමිණීම හේතුවෙන්, නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා උපඅංශය ද ඇතුළුව සංචාරක කර්මාන්තයට සම්බන්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් පහළ ගියේය.

තවද, COVID-19 වසංගතය පැතිර යෑම පාලනය කිරීමෙන් අනතුරුව ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබඳ අපේක්ෂා හේතුවෙන්, සේවා අංශයෙහි ප්‍රතිචාර දක්වන්නන් විසින් අනාගත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ සුබවාදී අදහස් දක්වා තිබුණි.

කෙසේ වුවද, විශ්‍රාම යෑම් සිදු වන අතර නව බඳවාගැනීම් සිදු නොකිරීම හේතුවෙන් පසුගිය මාසයට සාපේක්ෂව 2020 මැයි මාසයේ දී සේවා නියුක්තිය පහළ ගියේය.

| විචල්‍යය | අප්‍රේල් | මැයි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **29.8** | **43.1** | **+** | **අඩු වේගයකින් පහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 26.8 | 45.7 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 8.9 | 34.2 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 33.7 | 27.7 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 60.8 | 61.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 18.9 | 46.7 | + | අඩු වේගයකින් පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


මේ අතර, ප්‍රධාන වශයෙන්ම COVID-19 වසංගතයෙහි බලපෑම හේතුවෙන්, නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව තෙවන මාසයටත් ඉහළ ගිය අතර, එමගින් සමස්ත දර්ශකය තවදුරටත් පහළ යෑම පාලනය විය.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**43.1**

**2020 අප්‍රේල් මාසයට සාපේක්ෂව දර්ශකාංක 13.3ක ඉහළ යාමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, COVID-19 වසංගතයෙහි බලපෑම හේතුවෙන් අඛණ්ඩව සිව්වන මාසයටත් සේවා අංශයෙහි ක්‍රියාකාරකම්හි පහළ යෑමක් පෙන්නුම් කරමින් සමීක්ෂණ ඉතිහාසය තුළ වාර්තා වූ අවම දර්ශක අගය වන, 2020 අප්‍රේල් මාසයේ දී වාර්තා වූ 23.7හි සිට 2020 මැයි මාසයේ දී 35.2 දක්වා ඉහළ ගියේය.

ඇමරිකා එක්සත් ජනපදය, ජපානය, එක්සත් රාජධානිය සහ ඉන්දියාව යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින්, එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2020 මැයි මාසයේ දී පහළ ගිය බව පෙන්නුම් කරන ලද අතර, චීනයෙහි වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, ජූනි 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන

ගැනුම් තොගය : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය

නිමකිරීමට නියමිත කාර්යයන් : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම්

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.